# ජානවන්දනා වර්ෂය

"ජනවන්දනාව" යන්න ලිටුර්ජියා යන ග්‍රීක වචනයෙන් බිදී එන්නකි.

ලිටුර්ජියා = ලාඕස් + එර්ගොන්

ජනවන්දනාව ක්‍රිස්තුස් වහන්සේගේ පූජක කාර්ය ඉදිරියට ගෙන යන බවත් ජන වන්දනාවට ක්‍රිස්තුස් වහන්සේගේ ක්‍රිස්තු දේහය ඔවුන් වහන්සේ තුළින් පියාණන් වහන්සේට පුදන ප්‍රසිද්ධ වන්දනාව යි.

දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ - විශ්ව ලේපනය අංක 20

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ජනවන්දනාව පිළිබඳ අදහස,

අති ඉන්ද්‍රිය ක්‍රිස්තු දේහයේ වන ජේසුස් ක්‍රිස්තුස් වහන්සේත් එහි අවයව වන ශුද්ධ වූ සභාවත් දෙවියන් වහන්සේ ට කරන ප්‍රසිද්ධ පූර්ණ වන්දනාව ජනවන්දනාව යි.

ජනවන්දනාවේ ප්‍රධාන
- දිව්‍ය පූජාව
- දේව ප්‍රසාද නිධාන
- යාම යැදුම

ජනවන්දනා වර්ෂයේ කාලසීමාව සති 52 කි.

අන්තර්ගතය - ජී.ඩී.එන්. ප්‍රියන්තා මෙනෙවිය (වැලිකන්න විද්‍යාලය)
සැකසුම - ඒ.ඒ.ඩී.එස්. අමරකෝන් මෙනෙවිය(රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය)

ජනවන්දනා වසරේ වසර තුනකි.

| 1 වසර | 2 වසර | 3 වසර |
|---|---|---|
| ශු: මතෙව් සුබාරංචි | ශු: මාක් සුබාරංචිය | ශු: ලූක් සුබාරංචි |

ලෙස සුබාරංචි භාවිතා වේ.

**ජනවන්දනා වසරේ විවිධ කාල වකවානු,**




## ආගමන සමය

ආගමන සමය යනු, ක්‍රිස්තුස් වහන්සේගේ පැමිණීමයි.

ආගමන සමයේ ප්‍රධාන කොටස්,

- දෙවන පැමිණීමට සූදානම් වෙයි.
- පළමු පැමිණීම සැමරීමට සූදානම් වීම.

❖ නිල වශයෙන් ජනවන්දනා වර්ෂය ආගමන කාලයේ පළමු වන ඉරු දිනෙන් ආරම්භ වේ.

| | | | |
|---|---|---|---|
| සුදු වර්ණ | නත්තල් සමය සහ උත්ථාන | ශුද්ධවත්බවේ ද මහිමාන්විතබවවේ ද ආනන්දයේ ද අරුත ගෙනදෙයි. | ක්‍රි:ව: ගේ දේව මාතාවන්ගේ හා ශුද්ධවරයන්ගේ මංගල්‍යවලදී ය. |
| රතු | | ගින්නෙහි රුධිරයෙහි අරුත ගෙනදෙයි. | ශුද්ධාවත්මයාණන්ගේ මංගල්‍යය ප්‍රාණ පරිත්‍යාගිවරුන්ගේ මංගල්‍ය දින ගොබ් ඉරු දින මහා සිකුරාදා. |
| කොළ | සාමාන්‍ය සමය | බලාපොරොත්තු ව නව ජීවනය සහ වර්ධනය යන අරුත ගෙනදෙයි. | ආගමන හා චතාරික කාලයෙන් බැහැරවද විශේෂ මංගල්‍යයක් නොමැති සතියේ දින හා ඉරු දින. |
| දම් | ආගමන සමය සහ චතාරික සමය | පශ්චත්තාපය සහ බලාපොරොත්තු වේ ලක්ෂණයකි. | ආගමන කාලයේ හා චතාරික කාලයේද මළවුන් සඳහා පූජාවන් පවත්වන විට භාවිතා වේ. |

## නත්තල් සමය තුළ සමරන වැදගත් මංගල්‍යයන් 1 , 2 , 3 , 4

දෙසැම්බර් 25 - ක්‍රිස්තෝත්පත්තිය මංගල්‍යය.

දෙසැම්බර් 25 න් පසුව එන ඉරිදා ශු: පවුලේ මංගලෝත්සවය.

ජනවාරි 01 - පාරිශුද්ධ දේවමාතාවන් වන මරියෝත්තමාවන්ගේ මංගල්‍යය.

ජනවාරි 02ත් - 08ත් අතර යෙදෙන දිව්‍ය බිලිදාණන් රජුන්ට ප්‍රත්‍යක්ෂවීමේ මංගල්‍යය.

## චතාරික සමය යනු ,

- ප්‍රසිද්ධ ජීවිතය අරඹන්නට පෙර ජේසුස් වහන්සේ පාළුකරයේ ගතකළ යාච්ඤාවේ හා මර්ධනාවේ ජීවිතයට සමවැදෙන කාලය යි.
- පසුතැවිල්ලේ ආත්ම පරිත්‍යාගයේ හා ජීවිත වෙනසක් ඇතිකර ගැනීමේ කාලය යි.
- අපගේ ප්‍රසාද ස්නාපනීය ජීවිතය නව්‍යතාවයකට පත්කරන කාලය යි.
- ලෞකික ආශාවන්ට, ආත්මාර්ථයට මැරී , දෙවිඳුන් තුළ නිදහස් දරුවන් මෙන් ජීවත්වීමේ කාලය යි.

**චතාරික සමය තුළ අප කළ යුතු දෑ ,**

- ✓ මර්ධන ක්‍රියා කිරීම.
- ✓ දාන ධර්ම දීම.
- ✓ අසරණයන්ට පිහිටවීම.
- ✓ සමාව දීම.
- ✓ ශු: පැය හා පාද නමස්කාරය නමැති භක්ති අභ්‍යාසවල නිරතවීම.

අන්තර්ගතය - ජී.ඩී.එන්. ප්‍රියන්තා මෙනෙවිය (වැලිකන්න විද්‍යාලය)
සැකසුම - ඒ.ඒ.ඩී.එස්. අමරකෝන් මෙනෙවිය(රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය)

The National e-learning Portal for The General Education

**ශු: සතියේ ප්‍රධාන ජනවන්දනා දිනයන් ,**

- ගොබි ඉරුදින
- මහ බ්‍රහස්පතින්දා
- මහ සිකුරාදා
- අලේලූයියා සෙනසුරාදා

**සාමාන්‍ය සමය තුළ සමරන වැදගත් මංගල්‍යයන් ,**

- ශු: ත්‍රීත්වයේ මංගලෝත්සවය
- දිව්‍ය සත්ප්‍රසාද මංගලෝත්සවය
- දිව්‍ය හෘදයේ මංගලෝත්සවය
- සියලු සාන්තුවරයන්ගේ මංගලෝත්සවය
- මළවුන් සිහිපත් කරන දිනය
- ක්‍රිස්තු රාජාණන්ගේ මංගලෝත්සවය
- ශ්‍රී ලංකා අප ස්වාමිදූගේ මංගලෝත්සවය